www.AlevelApi.com

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 57 - නාට්‍ය හා රංග කලාව

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

 www.AlevelApi.com

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

## 57 - නාට්‍ය හා රංග කලාව

## ලකුණු දීමේ පටිපාටිය

## I පත්‍රයේ අභිමතාර්ථ

නාට්‍ය හා රංග කලාව පිළිබඳ මූලධර්ම, න්‍යාය සහ මූලික සිද්ධාන්ත පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ වේ.

මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය.

**I පත්‍රය ලකුණු බෙදීයාම**

I කොටස - බහුවරණ ප්‍රශ්න 40 කි. නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරට එක් ලකුණ බැගින් කෙටි ප්‍රශ්න 40 ට මුළු ලකුණු සංඛ්‍යාව 40 කි.

II කොටස - A හා B යනුවෙන් කොටස් දෙකකි. A හා B කොටස් දෙකෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

A හා B යන කොටස් දෙකෙහි ඇති සෑම ප්‍රශ්නයක් ම ව්‍යුහගත ආකාරයට සකස් කොට ඇත. එහි I, II, හා III යන අනුකොටස් සඳහා පිළිවෙළින් ලකුණු 04, ලකුණු 05, ලකුණු 06, බැගින් එක් ප්‍රශ්නයක් සඳහා මුළු ලකුණු සංඛ්‍යාව 15 කි.

A හා B යන කොටස්වල එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ප්‍රශ්න 04 කට මුළු ලකුණු 60 කි. (15 x4 = 60)

I කොටස හා II කොටසේ A හා B යන කොටස් දෙකෙන් තෝරාගත් ප්‍රශ්න 04 සඳහා මුළු ලකුණු සංඛ්‍යාව 40 + 60 = 100 කි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

## 57 - නාට්‍ය හා රංග කලාව

## ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රයේ අභිමතාර්ථ

නියමිත නිර්දිෂ්ට නාට්‍ය පෙළ අධ්‍යයනය පිළිබඳ අවබෝධය පරීක්ෂා කර බැලීම දේශීය නාට්‍ය කලාව හා විදේශීය නාට්‍ය කලාව පිළිබඳ දැනුම අවබෝධය සමග විශ්ලේෂණ හැකියාව මැන බැලීමත් මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ වේ.

මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය.

**II පත්‍රය ලකුණු බෙදීයාම**

I කොටස - බහුවරණ ප්‍රශ්න 40 කි. වඩාත් නිවැරදි පිළිතුරට එක් ලකුණ බැගින් මුළු ලකුණු 40 කි.

II කොටස - A හා B යනුවෙන් කොටස් දෙකකි. A දේශීය නාට්‍ය කලාව B දේශීය නාට්‍ය කලාව යනුවෙනි. එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයා තිබීම අපේක්ෂිත ය. සෑම ප්‍රශ්නයක් ම ව්‍යුහගත ආකාරයට සකස් කොට ඇත.

* එක් ප්‍රශ්නයකට අදාළ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 15 කි.
* පිළිතුරු සඳහා හිමිවන මුළු ලකුණු 15x4 = 60

I කොටස හා II කොටසේ A හා B යන කොටස් වලින් ප්‍රශ්න 02 බැගින් II පත්‍රය සඳහා මුළු ලකුණු 40 + 60 = 100 කි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස.(උ.පෙළ) විභාගය/ க.பொ.த (உயர் தர)ப் பரீட்சை - 2018**

විෂයය අංකය / பாட இலக்கம் : **57**

විෂයය / பாடம் : **නාට්‍ය හා රංග කලාව I**

**ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம் - I පත්‍රය - I කොටස/பத்திரம் I**

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 1 | 31. | C.G.I. |
| 02. | 5 | 12. | C.H.P | 22. | 1 | 32. | H.I.L. |
| 03. | 4 | 13. | A.J.M | 23. | 1 | 33. | 5 |
| 04. | 5 | 14. | D.G.Q | 24. | 4 | 34. | 2 |
| 05. | 5 | 15. | B.K.R | 25. | 2 | 35. | 3 |
| 06. | 4 | 16. | F.I.O | 26. | 3 | 36. | 2 |
| 07. | 4 | 17. | E.L.N | 27. | 4 | 37. | 2 |
| 08. | 3 | 18. | 3 | 28. | 5 | 38. | 3 |
| 09. | 1 | 19. | 3 | 29. | A.D.F | 39. | 1 |
| 10. | 5 | 20. | 4 | 30. | B.E.K. | 40 | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com

## නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

## II කොටස

## A කොටස

01. (i) **නාට්‍ය කලාව හැර වෙනත් ප්‍රාසංගික කලා ප්‍රභේද හතරක් නම් කරන්න.**

බැලේ, ඔපෙරා, මුද්‍රා නාට්‍ය, ඉඟිනළු, ගීත නාටක, සංගීත සංධ්වනි, ශාන්ති කර්ම, සංගීත ප්‍රසංග, නර්තන ප්‍රසංග, සංගීත සන්දර්ශන

**හතරක් නම් කර ඇත්නම් ලකුණු 04**

(ii) **මෙවායින් දෙකක් පිළිබද වෙන වෙනම පැහැදිලි කරන්න.**

පළමු වැනි කොටසට අපේක්ෂකයා සපයා ඇති පිළිතුරු අතරින් දෙකක් තෝරාගෙන එක් කලාවකට අදාළ කරුණු 05 ක් ලියා ඇත්නම් ලකුණු 2 ½ +2 ½ = 5

(iii) **ඉහත සදහන් කළ එක් කලාවක් නාට්‍ය කලාව හා සංසන්දනය කරමින් විමර්ශනයක් කරන්න.**

**නාට්‍ය කලාවේ :-**

- සංකල්පයක්/අදහසක්/අත්දැකීමක්/සත්‍ය සිදුවීමක්/කල්පිත පුවතක්/පුරාවෘත්තයක් හෝ ඓතිහාසික සිදුවීමක් නාට්‍යෝචිත අවස්ථා මතු වන පරිදි නිර්මාණය කළ හැකි ය.
- විවිධ පරිසර, යුග කාල වකවානු අවශ්‍ය පරිදි නිරූපණය කළ හැකි ය.
- චරිතවල සියුම් මනෝගති, මනෝභාව ඉස්මතු කළ හැකි ය.
- චරිතාන්තර ගැටුම් අවස්ථා විවිධාකාරයෙන් ඉදිරිපත් කළ හැකි ය.
- විවිධ ශෛලීන්ට හා රංග රීතීන්ට අනුව නාට්‍ය නිෂ්පාදනය කළ හැකි ය.
- නාට්‍ය ආකෘතිය/සන්දර්භය නොයෙක් ආකාරයට සැකසිය හැකි ය.
- පැය කිහිපයක් වුව අඛණ්ඩ ව රඟ දැක්විය හැකි වීම.
- නාට්‍ය ධර්මී හා ලෝකධර්මී වශයෙන් ප්‍රභේද වේ.
- ට්‍රැජඩි, කොමඩි ආදි ආකෘති වශයෙන් ද ස්වාභාවික යථාර්ථවාදී, ප්‍රකාශනවාදී, අසංගත (ඇබ්සර්ඩ්) ආදි රීති වශයෙන් ද වර්ග වේ.
- චතුර් අභිනය භාවිතා වන අතර බොහෝ විට වාචික අභිනය මූලික වේ.
- ආනුෂංගික අංග උපරිම වශයෙන් මෙන්ම අවම වශයෙන් ද භාවිත කිරීමට ඉඩ ඇත.
- ඔපෙරා, බැලේ, මුද්‍රා නාට්‍ය, ආදි ප්‍රාසංගික කලා වර්ග වල පොදු නිර්ණායක පද්ධතියක් ඇත. නිදසුන් ලෙස ඔපෙරාවට ගායනය ද බැලේ නාට්‍යයට නර්තනය ද, ගීත නාට්‍යයට ගීතය ද ඉඟි නළුවට අභිනය ද මූලික වේ.

**මෙවැනි කරුණු 03 ක් සමග ප්‍රාසංගික කලාවක් සංසන්දනය කරමින් විමර්ශනය කිරීම ලකුණු 06.**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

02. (i) **රංග කලාවේ දී ප්‍රොසීනියම් වේදිකාව අදෘශ්‍යමාන ලෙස කොටස්වලට බෙදනු ලබන ආකාර දෙකක් දක්වන්න**

කොටස් 6 කට, කොටස් 9 කට, කොටස් 12 කට වශයෙන්

**ලකුණු 04**

(ii) **එසේ වෙන් කිරීමෙන් ඇති ප්‍රයෝජන කවරේ දැයි පැහැදිලි කරන්න.**

- රංග භූමියේ අවකාශය පිළිබඳ නිවැරදි අවබෝධයක් රූපණ ශිල්පීන්ට හා ආනුෂංගික ශිල්පීන්ට ලබා ගැනීමට විශේෂයෙන් ම රංග වින්‍යාසය සඳහා ප්‍රයෝජනවත් වේ.
- රූපණ කාර්යය පහසුවෙන් කර ගැනීම සඳහා
- රංගාලෝක සැලසුම් සඳහා
- අධ්‍යක්ෂකවරයා ගේ කාර්යය පහසු කර ගැනීමට
- රූපණ ශිල්පියාගේ හඬ ප්‍රක්ෂේපණය කළමනාකරණය කර ගැනීමට
- පසුතල සැලසුම් සඳහා

**කරුණු පහක් පැහැදිලි කර ඇත්නම් ලකුණු 05**

(iii) **ලෝකධර්මී සම්ප්‍රදායේ නාට්‍යයක් සඳහා ප්‍රොසීනියම් වේදිකාවක ගගනිකාව කෙසේ ප්‍රයෝජනයට ගත හැකි දැයි පැහැදිලි කරන්න.**

- නිශ්චල ඡායාරූප හෝ වීඩියෝ දර්ශන ප්‍රක්ෂේපණය කිරීමට
- නාට්‍යයේ අදාළ පසුතල දර්ශන මැවීමට
- රංගාලෝක උපක්‍රම භාවිතා කිරීම මගින් නාට්‍යයේ අර්ථය තීව්‍ර කිරීමට
- කාලය (දිවා, රාත්‍රි ආදී) හැඟවීමට
- නාට්‍යයට අදාළ ව විචිත්‍රවත් ප්‍රේක්ෂාවක් මැවීමට

**කරුණු 3 ක් වත් පැහැදිලි කර ඇත්නම් 2 X 3 = 6**

03. (i) **නාට්‍යයකට සංගීතයෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් දක්වන්න.**

1. නාට්‍යෝචිත පරිසරය මැවීමට උපකාරී වීම.
2. නාට්‍යෝචිත අවස්ථා තීව්‍ර කිරීම
3. ප්‍රේක්ෂක මනෝභාව උද්දීපනය කිරීම
4. නාට්‍යමය පරිසරය, චිත්තරූප මැවීම
5. නළු කාර්යය පහසු කරලීම
6. ප්‍රාසංගික බව උද්දීපනය කිරීම

**මෙවැනි කරුණු 04 ක් දක්වා ඇත්නම් ලකුණු 04**

(ii) **ගායනය හා වාද්‍ය භාණ්ඩ භාවිතය හැරුණු විට නාට්‍යයකට සංගීතය සපයා ගත හැකි වෙනත් ක්‍රම සඳහන් කොට ඒ ගැන පැහැදිලි කරන්න.**

- පටිගත කළ සංගීතය යොදාගැනීම
- නළුවා ගේ අත් පා වැනි ශාරීරික අංග භාවිතයෙන් රිද්මානුකූල ශබ්ද නිපදවා ගැනීම
- ආදේශ භාණ්ඩ භාවිතය (පොල් කටු /බුලි/ Xray කොළ/ප්ලාස්ටික් බෝතල්)
- කටහඬ යොදා ගනිමින් සංගීත භාණ්ඩවල නාද අනුකරණය කිරීම

**මෙවැනි කරුණු අවම වශයෙන් දෙකක් වත් පැහැදිලි කර ඇත්නම් 2½ + 2½ = 5**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(iii) **වේදිකා නාට්‍යයකට ජීවමාන සංගීතය යොදා ගැනීම හා පටගත කළ සංගීතය යොදා ගැනීම පිළිබඳ ඔබේ අදහස් නිශ්චිත කරුණු යටතේ සාකච්ඡා කරන්න.**

- වේදිකා නාට්‍යයට වඩාත් උචිත වන්නේ ජීවමාන සංගීතය යි. එහෙත් අවශ්‍ය පරිදි පටිගත කළ සංගීතය ද යොදාගත හැකි ය.

**ජීවමාන සංගීතය**

| වාසි | අවාසි |
|---|---|
| 1. නළුවා ගේ රංග කාර්යය පහසු කරයි | 1. නිෂ්පාදන පිරිවැය වැඩි ය. |
| 2. ප්‍රේක්ෂක රස වින්දනය තීව්‍ර කරයි | 2. අධික ශබ්ද වැනි ප්‍රායෝගික ගැටලු පැන නගින අවස්ථාවක දී නාට්‍යයට බාධාවක් වීම |
| 3. අවස්ථෝචිත ව යොදාගත හැක | |
| 4. ප්‍රේක්ෂක ආකර්ෂණය ලබාගැනීම | |
| 5. තාක්ෂණික මෙවලම් සහ විදුලිබලය වැනි දේ අනවශ්‍ය වීම | |

**පටිගත කළ සංගීතය**

| වාසි | අවාසි |
|---|---|
| 1. ගායන/වාදන ශිල්පීන් විශාල සංඛ්‍යාවක් අවශ්‍ය නොවීම | 1. අවස්ථෝචිත ව සංගීතය වෙනස් කළ නොහැකි ය |
| 2. පටිගත කරන ලද සංගීතය අඩංගු උපකරණ ක්‍රියා කරවන්නා පමණක් සිටීම ප්‍රමාණවත් ය. | 2. විදුලිය ඇණ හිටීමක දී හෝ තාක්ෂණික උපකරණ නොමැති අවස්ථාවක සංගීතය බාධාකාරී වේ. |
| 3. ශබ්ද පරිපාලනය පහසු වීම | 3. නාට්‍යමය ගුණය හීනවීම. |

**නාට්‍ය සංගීතය යොදා ගැනීමේ උචිත අනුචිත භාවය පිළිබඳව ඉහත කරුණු 03 ක් වත් සාකච්ඡා කර ඇත්නම් සම්පූර්ණ ලකුණු 06**

04. (i) **ඇරිස්ටෝටල් කාව්‍යශාස්ත්‍රයේ දක්වා ඇති ශෝකාත්ම (tragedy) නාට්‍යයක මුඛ්‍යාංග හයෙන් 1 සිට 4 දක්වා අංග අනුපිළිවෙළින් නම් කරන්න.**

කතා වස්තුව -චරිත - චින්තනය - වාග්විලාසය **ලකුණු 04**

(ii) **එහි පළමුවැනි අංගය පිළිබඳ විස්තරයක් කරන්න.**

**කථා වස්තුව**

ග්‍රීක ශෝකාත්ම නාට්‍යයක මූලික ම අංගය කථා වස්තුව ලෙස ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රයේ සඳහන් කර ඇත. කථා වස්තුව යනු පුරා කථාවේ සිද්ධි ගැළපීමේ පිළිවෙළ යි. ට්‍රැජික් වීරයා සෞභාග්‍යයේ සිට දුර්භාග්‍යය කරා ගමන් ගන්නා ආකාරය යි. සරල හා සංකීර්ණ වශයෙන් කොටස් දෙකකි. ක්‍රියාවේ ඒකාග්‍රතාවය, ආකුලීකරණය, අනාවරණය, ප්‍රත්‍යාවර්ථනය සහ ප්‍රත්‍යභිඥානය ගැන ලිය වී ඇත්නම්

**ලකුණු 05**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(iii) **ග්‍රීක ශෝකාත්ම නාට්‍යයේ රංග ශෛලිය ගැන විස්තරයක් කරන්න**

**ග්‍රීක රංග භූමිය**

- මකුට හා පාවහන් මගින් නළුවන්ගේ ශරීර ප්‍රමාණ විශාල කොට දක්වීම (ඔන්කොස්, කොතුර්නොස්, ලෝගු)
- වෙස් මුහුණු භාවිතය
- පශ්චාද් දෘෂ්ටි කථන ක්‍රමය අනුගමනය කිරීම
- ගායන වෘන්දය රංග කාර්ය සඳහා යොදාගැනීම
- මරණය වැනි භීෂණ ක්‍රියා වේදිකාවේ රඟ නොදැක්වීම
- එක්කුක්ලිමා හෙවත් චක්‍රමංචකය හා මකීනා හෙවත් දොඹකරය ආදි උපකරණ භාවිත කිරීම
- ස්කීනි ගොඩනැගිල්ල පසුතලය ලෙස සැලකීම
- පිරිමින් පමණක් රඟපෑම
- ප්‍රධාන චරිත සඳහා නළුවන් දෙදෙනෙකු හෝ තිදෙනෙක් පමණක් සහභාගී කර ගැනීම

**මෙවැනි කරුණු 6ක් විස්තර කර ඇත්නම් ලකුණු 06යි.**

05. (i) **මධ්‍යකාලීන යුරෝපීය ජන වන්දනා නාට්‍ය වර්ග හඳුන්වාදෙන්න.**

මිස්ටරි, මිරැකල්, මොරැලිටි
(අද්භූත, ප්‍රාතිහාර්ය විෂයක, සදුපදේශ)

**ලකුණු 03**

(ii) **ඒවායින් නාට්‍ය වර්ග දෙකක් පිළිබඳ විස්තරයක් කරන්න.**

**මිස්ටරි**

- බයිබලයේ පැරණි ගිවිසුමේ සිදුවීම් සහ නව ගිවිසුමේ අන්තර්ගත ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ විවිධ සිදුවීම් තේමා කරගත් නාට්‍ය වර්ගයකි.
- පාස්කු හා නත්තල් සමයේ රඟ දක්වේ.
- මෙම වර්ගයේ ප්‍රථම නාට්‍යය ලෙස (The Mistery of Adam) ලියැවී ඇත. පල්ලියේ ප්‍රධාන දොරටුව අබියස ලතින් භාෂාවෙන් සවිස්තර ව රඟදක්වේ.
- බයිබලයේ ජේසුස් වහන්සේගේ ජීවිතය සම්බන්ධ කථා පුවත් පසුබිම් කොට ගැනේ.

**මිරැකල්**

- සාන්තුවරයින්ගේ හා ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතවල ප්‍රතිහාර්ය සිදුවීම් අළලා රචනා වී ඇත.
  උදා:- ජේසුතුමා ජලය මිදි යුෂ බවට හැරවීම.
  ශාන්ත ඇපලෝනියා ගේ කථාව
  ශාන්ත සිසිලියා ගේ කථාව



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**මොරැලිටි**

- මිනිසාට යහපත් උපදේශයන් ලබාදෙන නාට්‍ය වර්ගයකි.
- ප්‍රේමය, සාමූහිකත්වය, සහජීවනය, ජීවිතය, මරණය ආදී සංකල්ප තේමා කර ගැනීම,
- මනුෂ්‍යත්වය පිළිබඳ ගුණධර්ම ඉස්මතු කිරීම. ධනය, බලය, සෞඛ්‍යය, අලසකම, පිං පව් වැනි ධර්මතා චරිත මගින් නිරූපණය කිරීම

උදා :- ජීවිත ගර්වය, උද්‍යාන වීර්යයේ මාලිගාව, සකලජන

**ඉහත නාට්‍ය වර්ග දෙකක් ගැන ලියා ඇත්නම් ලකුණු 3 x 2 = 06**

(iii) **ශ්‍රී ලංකාවේ ප්‍රචලිත පසන් හෙවත් පාස්කු නාට්‍ය සම්බන්ධ විස්තරයක් කරන්න.**

- පිටිපන, දූව, බොරලැස්ස, යාපනය, මන්නාරම ප්‍රදේශවල වාර්ෂික ව රඟදැක්වීම
- ක්‍රිස්තුස් වහන්සේගේ දුඃඛප්‍රාප්තිය වන්දනා ස්වරූපයෙන් රඟ දැක්වීම
- මුල් කාලයේ දී සුරුවම් භාවිතා කෙරුණි පසුව නළුවන් චරිත නිරූපණය කරමින් රඟ දක්වා ඇත.
- කතෝලික ලබ්ධිකයින් රූපණ කාර්යයේ නිරත වී ඇත.
- සවස් කාලයේ රඟ දැක්වීම
- ක්‍රිස්තුස් වහන්සේ ගේ අවසන් පාස්කු භෝජනයේ සිට කුරුස පත් කිරීම දක්වා සිදුවීම් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම
- අංග රචනය සහ වේශභූෂණ තාත්වික ආකාරයෙන් යොදා ගැනීම

**අවම වශයෙන් කරුණු දක්වා විස්තර කර ඇත්නම් ලකුණු 06**

06. (i) **එළිසබෙතීන රඟහලක රංග භූමියේ ප්‍රධාන කොටස් නම් කරන්න.**

1. ඒප්‍රනාකාර වේදිකාව
2. අභ්‍යන්තර වේදිකාව (අධ්‍යයනාගාරය)
3. උපරි වේදිකාව
4. නිරය
5. සඳළු තලය

**ලකුණු 04**

**(ii) එම කොටස් අතුරින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුවන කොටස ගැන පැහැදිළි කිරීමක් කරන්න.**

1. **ඒප්‍රනාකාර වේදිකාව**

- රංගය සඳහා ප්‍රධාන වශයෙන් භාවිතා කරන්නේ ඒප්‍රනාකාර වේදිකාවයි.
- එහි ඉදිරිපස පළල අඩි 24 ක් පමණ වන අතර, පසුපස කෙළවර පළල අඩි 43 කි. පොළොව මට්ටමේ සිට අඩි 04 ක් පමණ උසකින් යුක්තය. වේදිකාව මධ්‍යයේ විශාල උමං දොරටුවක් පිහිටා ඇත.
- ඉදිරියේ සිට අඩි 12 ක් පමණ පිටුපසට වන්නට විශාල කුලුණු දෙකක් ඇත.
- ඒප්‍රන වේදිකාවට ඉහළ ඇති වියන ස්වර්ගය ලෙස හඳුන්වයි.

**ඉහත කරුණු අනුව ප්‍රමාණවත් ලෙස පැහැදිලි කර ඇත්නම් ලකුණු 05**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(iii) එළිසබෙතීන යුගයේ රංග ශෛලිය කෙරෙහි අවධානය යොමු කරමින් සමස්ත වේදිකාවේ නාට්‍යමය ශක්‍යතාව පැහැදිලි කරන්න.**

- එළිසබෙතීන යුගයේ නාට්‍ය වේදිකා ගත කිරීම සඳහා ග්ලෝබ් රඟහලේ වේදිකාවේ සැකැස්ම විශේෂයෙන් බලපා ඇත.
- විශාල කුළුණු දෙක නාට්‍යයෙහි වනාන්තරයක ගස් ලෙසත්, ගොඩනැගිල්ලක කුළුණු ලෙසත්, භාවිත කර ඇත.
- අධ්‍යයනාගාරය නමැති කොටස නාට්‍යයේ විවිධ අවස්ථා රඟ දැක්වීම සඳහා භාවිත කර ඇත.
- හැම්ලට් නාට්‍යයේ ගර්භ නාට්‍යය රඟ දැක්වූයේ එහි ය.
- අධ්‍යයනාගාරයට ගොස් වෙනත් පසෙකින් නළුවන් පිටතට ඒම වැනි අවස්ථා ජූලියස් සීසර් නාට්‍යයේ ඇත.
- අවතාර, අතිමානුෂ ආදි චරිතවල ප්‍රවේශය සඳහා වේදිකාවේ ඇති උමං දොරවල් උපකාර විය
- රෝමියෝ- ජූලියට් නාට්‍යයේ ඔවුන් දෙදෙනාගේ හමුවීම පෙන්වන්නේ සඳළු තලයේ ය.

**අවම වශයෙන් කරුණු 03 ක් වත් පැහැදිලි කර ඇත්නම් ලකුණු 06**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

### අ.පො.ස.(උ.පෙළ) විභාගය/ க.பொ.த (உயர் தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம் : 57 | විෂයය / பாடம் : නාට්‍ය හා රංග කලාව II

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம் - I පත්‍රය - I කොටස/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 4 | 21. | A | 31. | 2 |
| 02. | 1 | 12. | B, J, K | 22. | D | 32. | 5 |
| 03. | 5 | 13. | A, I, O | 23. | B | 33. | 3 |
| 04. | 3 | 14. | C,G,L | 24. | 5 | 34. | 4 |
| 05. | 4 | 15. | H,M,N | 25. | 3 | 35. | 2 |
| 06. | 2 | 16. | D,E,F | 26. | 1 | 36. | 5 |
| 07. | 1 | 17. | 3 | 27. | 4 | 37. | 4 |
| 08. | 5 | 18. | 3 | 28. | 2 | 38. | 2 |
| 09. | 2 | 19. | E | 29. | 1 | 39. | 1 |
| 10. | 3 | 20. | C | 30. | 4 | 40 | 2 |



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



# නාට්‍ය හා රංග කලාව - 11 පත්‍රය
## 11 කොටස

## A කොටස

**1. (i) 60 දශකයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ නාට්‍ය හතරක නම් සහ ඒවායේ නිෂ්පාදකයන්ගේ නම් සඳහන් කරන්න.**

**එදිරිවීර සරච්චන්ද්‍ර** - සිංහබාහු, හස්තිකාන්ත මන්තරේ, මහාසාර, පේමතෝ ජායතී සෝකෝ

**ධම්ම ජාගොඩ** - තම්මැන්නා, වෙස් මුහුණු, මළවුන් නැගිටියි

**බන්දුල ජයවර්ධන** - සෝෂක වස්තුව, දියසේන නොපැමිණීම, ස්වර්ණ හංස, බෙරහඬ, බිහිවනු බෝසතාණෙනි,

**සුගතපාල ද සිල්වා** - බෝඩිංකාරයෝ, තට්ටු ගෙවල්, හරිම බඩු හයක්, හෙලේ නැග්ග ඩෝං පුතා, නිල් කට්රොල් මල්, හිත හොඳ අම්මණ්ඩි,

**රංජිත් ධර්මකීර්ති** - නැංගුරම්, එක වහළ යට, මහ ගෙදර,

**හෙන්රි ජයසේන** - හුණුවටයේ කතාව, ජනේලය, තවත් උදෑසනක්, දිරිය මව, මනරංජන වැඩ වර්ජන, අපට පුතේ මගක් නැතේ, මකරා,

**දයානන්ද ගුණවර්ධන** - නරිබෑණා, ඇමති පට්ටම, බක්මහ අකුණු,

**ගුණසේන ගලප්පත්ති** - මූදු පුත්තු, දේවතා එළි, දෑස නිසා, ලියතඹරා, තාත්තා,

**ඉහත සඳහන් නාට්‍ය හෝ 60 දශකයට අයත් වෙනත් නාට්‍යය සහ නිෂ්පාදකයා නිවැරදි ව නම් කර ඇත්නම් පිළිතුරු 4ට ලකුණු 04 යි. (නිෂ්පාදකයා හා නාට්‍ය දෙක ම නිවැරදි ව තිබීම අවශ්‍ය ය).**

**(ii) ඉහත පිළිතුරට ඔබ ලියූ නිෂ්පාදකයන් දෙදෙනෙකු පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.**

**ඉහත පිළිතුරෙහි සඳහන් කොට ඇති නිෂ්පාදකයන් දෙදෙනෙකු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ලියා ඇත්නම් ලකුණු 2 1/2 x 2= 05**

**(iii) 60 සහ 70 දශකවල පොදුවේ දේශීය නාට්‍ය කලාව පිළිබඳ විමර්ශනයක් කරන්න.**

- දේශීය නාට්‍ය කලාවේ ස්වර්ණමය යුගය බව,
- මෙරට පුරෝගාමී නාට්‍යකරුවන් පස්දෙනාගේ කැපී පෙනෙන නිර්මාණ මෙම දශකයේ නාට්‍ය කලාවේ ප්‍රචලිත නිර්මාණ වූ බව
- විවිධ තේමා යටතේ නාට්‍ය නිර්මාණය වූ බව හා සමාජ දේශපාලන ගැටලු නාට්‍ය නිර්මාණ සඳහා ප්‍රස්තුත වූ බව
- විවිධ රංග ආකෘති අත්හදා බැලූ බව
- නාට්‍ය රචකයන් මෙන්ම නිෂ්පාදකයන් විශාල සංඛ්‍යාවක් බිහි වූ බව



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- ස්වීය නාට්‍ය නිර්මාණ හා විදේශීය නාට්‍ය කෘති අනුවර්තන, පරිවර්තන, වශයෙන් නිෂ්පාදනය වූ බව
- නාට්‍ය නැරඹීම සඳහා උසස් රසිකත්වයෙන් යුත් සහෘදය පිරිසක් සිටි බව
- වීදි නාට්‍ය ආදි විකල්ප නාට්‍ය ප්‍රභේද බිහි වූ බව

**ඉහත සඳහන් කරුණු හෝ වෙනත් අදාළ කරුණු 06ක් අවම වශයෙන් ලියා තිබේ නම් ලකුණු 06ක් ලබා දිය හැකි ය.**

2 **(i) සුබ සහ යස නාට්‍යයේ නායකයා එහි ප්‍රතිනායකයා ප්‍රිය කිරීමට හේතු දෙකක් දක්වන්න.**

- සුබගේ දේහ ලක්ෂණ තම දේහ ලක්ෂණවලට සමාන වීම,
- බුද්ධිමත් පුද්ගලයකු වීම,
- සම්ප්‍රදායට පටහැනි ව සිතන්නකු වීම,
- රජුගේ සිතුම් පැතුම්වලට සමාන අයුරින් සිතීම

**ඉහත කරුණු අතරින් දෙකක් ලියා ඇත්නම් ලකුණු 04 ක් දිය හැක.**

**(ii) මෙම නාට්‍යයේ නායකයා හා ප්‍රතිනායකයා අතර ගැටුමක් පවතීද? නැති ද? විමර්ශනය කරන්න.**

- නායකයා හා ප්‍රතිනායකයා අතර ගැටුමක් පවතී. එම ගැටුම පවතින්නේ යසලාලකතිස්ස නම් රජු හා සුබ අතර ය. සුබ හා යස අතර නොවේ. යස ඔහු නොමරන්නේ ඔහු රජුට විනා යස නම් පුද්ගලයාට තර්ජනයක් නොවන නිසා ය. සුබ කැරලි ගසන්නේ රාජ්‍යය පැහැර ගැනීමට ය. එහෙයින් රජුට ද එරෙහි විය යුතු ය. සුබ දන ගසන්නේ රජු ඉදිරියේ නොව රජුගේ මනුෂ්‍යත්වය ඉදිරියේ ය. මෙම ගැටුම ඉතා සියුම් ලෙස
  නාට්‍යයට බද්ධ කොට ඇත.
- සුබ හා යස සමාන සිතුම් පැතුම් ඇත්තන් වන බැවින් ගැටුමක් නැතැ යි කෙනෙකුට තර්ක කළ හැකි ය. එහෙත් දෙදෙනා ම සමාන අදහස් ඇත්තන් වීමත්, බුද්ධිමත් වීමත්, සම්ප්‍රදාය නුරුස්නා අය වීමත් හේතුවෙන් ඔවුන් අතර ගැටුමක් පවත්නා බව හැඟේ. ඔවුන් එකිනෙකා පරයමින් නැගී සිටී. යස සුබගේ බිරිය දිනා ගැනීම එවන් අවස්ථාවකි. සුබ රජු දිනා ගැනීම තවත් අවස්ථාවකි.

**ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. ලකුණු 05**

**(iii) නායක ප්‍රතිනායක චරිත දෙකින් වඩාත් විප්ලවකාරි ලෙස ඔබ සලකන්නේ කවුරුන් දැයි සඳහන් කර, එය කරුණු දක්වමින් සනාථ කරන්න.**

- වඩාත් විප්ලවකාරි චරිතය වන්නේ යසලාලකතිස්ස රජු ය. ඔහු රාජ්‍යත්වය මෙන්ම ඒ හා බැඳි සියලු සම්මතයන් ප්‍රතික්ෂේප කරන්නේ නිදහසට ඇලුම් කිරීම හේතුවෙනි. කිසිදු නීතියක් වෙනස් කිරීමට නොහැකි රාජ්‍යත්වය ඔහු නුරුස්ස යි. සුබ කැරලි ගසන්නේ රාජ්‍ය බලය අල්ලා ගැනීමට යි. යස සිය රාජ සභාවට හෝ අමාත්‍යවරුනට තමන් ඉක්මවා යාමට කිසි විටෙක ඉඩ නොදෙ යි. එහෙත් සුබට කැරලිකරුවන් පාලනය කරගත නොහැකි වේ.

**ලියා ඇති කරුණු සලකා බලා ලකුණු දෙන්න. ලකුණු 06**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

3 (i) "හස්තිකාන්ත මන්තරේ" නිෂ්පාදනය සඳහා නාට්‍යකරුවා ආභාසය ලබාගත් රංග ශෛලි දෙක නම් කරන්න.

- සංස්කෘත නාට්‍යයේ රංග ශෛලිය
- චීන රංග ශෛලිය

**මෙම කරුණු දෙක නිවැරදි ව ලියා ඇත්නම් ලකුණු 04**

(ii) **එම රංග ශෛලි දෙකෙහි ආභාසය නාට්‍යයෙහි විද්‍යමාන වන ආකාරය පෙන්වා දෙන්න.**

**සංස්කෘත රංග ශෛලිය-**

- අවස්ථෝචිත ලෙස පද්‍ය යොදා තිබීම,
  **නිදසුන්ඃ** පරිසර වර්ණනා, හස්තිකාන්ත මන්තරය%

- විශේෂ ප්‍රවේශ විධි යොදාගැනීම,
  **නිදසුන්ඃ** චණ්ඩපජ්ජෝත රජු රථාරූඪ ව රංග භූමියට පැමිණීම, චන්දිහට්ටයින් අශ්වාරූඪ ව ප්‍රවේශ වීම

- වේෂභූෂණ හා නර්තනය නාට්‍යධර්මී ශෛලියට අනුව යොදා ගැනීම
  **නිදසුන්ඃ** යුද අවස්ථා, උදයන රජු කෘත්‍රිම ඇතු හඹා යාම,

- කක්ෂ්‍යා විභාග භාවිතාව,
  **නිදසුන්ඃ** වෙළඳුන් පසෙක සිටින අතර, රජුගේ සම්ප්‍රාප්තිය

- පරික්‍රමණ අවස්ථා යොදාගැනීම,
  **නිදසුන්ඃ** වෙළඳුන්ගේ පැමිණීම, රජු රඟෙන වටයක් යාම

- රඟපෑමේ දී මුද්‍රා හා හස්ත භාවිතය,
  **නිදසුන්ඃ** පඬිවරුන් දෙදෙනා සාකච්ඡා කිරීම

- අවස්ථා තීව්‍ර කිරීම පිණිස ශබ්ද යොදාගැනීම
  **නිදසුන්ඃ** යුදමය අවස්ථා නිරූපණයට බෙර හඬ සහ සක් නද යෙදීම

**චීන රංග ශෛලිය**

- කෘත්‍රිම හස්තියා ඇතුළේ සෙබලුන් සිටින ආකාරය, සෙබලුන්ගේ වේෂභූෂණ,

**ශෛලි දෙකෙහි ආභාසය විද්‍යමාන වන ආකාරය කරුණු පහක් යටතේ ප්‍රමාණවත් අයුරින් සාකච්ඡා කොට ඇත්නම් ලකුණු 05 ලබා දෙන්න.**

(iii) "**හස්තිකාන්ත මන්තරේ නාට්‍ය විචාරයට ලක් කරන්න.**

**නාට්‍යයෙහි තේමාව, රංග ශෛලිය, ලබා දෙන පණිවුඩය සහ නාට්‍ය රසය ආදි කරුණු ගැන අවධානයෙන් නාට්‍යයේ සාධනීය බව හෝ නොවන බව විචාරය කොට ඇත්නම් ලකුණු 6 ලබා දෙන්න.**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## B - විදේශීය නාට්‍ය කලාව

4. (i) සංස්කෘත නාට්‍ය කලාවේ හමුවන නායක වර්ග නම් කරන්න.

1. ධීරෝදාත්ත
2. ධීරලලිත
3. ධීරප්‍රශාන්ත
4. ධීරෝද්ධත

**ලකුණු 04**

**(ii) "අභිඥානශාකුන්තලයේ" නේතෘ ඉන් කුමන වර්ගයට අයත් වන්නේ දැ යි දක්වා, ඊට හේතු පැහැදිලි කරන්න.**

"අභිඥානශාකුන්තලයේ" නේතෘ වන්නේ දුෂ්‍යන්ත රජතුමා ය. ඔහු ධීරෝදාත්ත නායකයෙකි. තේජෝබල සම්පන්න, උදාර, ධෛර්ය සම්පන්න, විනයගරුක, චිත්තාකර්ෂණීය මෙන්ම මුදු ගුණයෙන් යුත් චරිතයකි.

**නායක වර්ගය නිවැරැදිව දැක්වීමට ලකුණු 2 සහ ප්‍රමාණවත් ලෙස විස්තර කොට ඇත්නම් ලකුණු 3 බැගින් දෙන්න.**

(iii) **අවස්ථා පංචකයේ ඉෂ්ටාර්ථ සිද්ධවන අවස්ථාව හෙවත් නියතඵලප්‍රාප්තිය සිදුවන්නේ 'අභිඥානශාකුන්තලයේ' කවර අංකයේ කවර අවස්ථාවේ දැ යි පැහැදිලි කරන්න.**

- සයවන අංකයේ දී ය.
- නැති වූ මුදුව ලැබීමෙන් පසුව රජුගේ ස්මෘතිය අවදි වීමේ ප්‍රතිඵලයක් ලෙස නියතඵලප්‍රාප්ති අවස්ථාව එළැඹේ. ශකුන්තලා හා තපෝවනයේ ගත කළ කාලය සිහිපත් වීමෙන් අධික ශෝකයට පත් වන රජුට ඇය යළි හමුවේ ය යන බලාපොරොත්තුව ප්‍රේක්ෂකයා තුළ ජනිත වීම මෙහි දි සිදු වේ.

**අංකය සහ අවස්ථාව පැහැදිලි ලෙස දක්වා ඇත්නම් ලකුණු 06**

5. **(i). 'ජූලියස් සීසර්' නාට්‍යයේ කැසියස් ගේ හෝ 'ඔතෙලෝ' නාට්‍යයේ ඉයාගෝ ගේ චරිතයේ හෝ දුර්ගුණ හතරක් දක්වන්න.**

**කැසියස්**

- ඊර්ෂ්‍යා සහගත බව
- දුෂ්ට බව
- සිය අභිමතය සාක්ෂාත් කරගැනීමට ප්‍රයෝගකාරී ලෙස අන්‍යයන් මෙහෙයැවීම
- ද්වේෂ සහගත සිතින් යුතු ව පළිගැනීමට සැලසුම් කිරීම
- අල්ලසට තනතුරු ලබා දීම

**ඉයාගෝ**

- දුෂ්ට බව
- පළිගැනීමේ චේතනාවෙන් ක්‍රියා කිරීම
- ඊර්ෂ්‍යා සහගත බව
- ව්‍යාජ අවංකත්වයක් ප්‍රදර්ශනය කිරීම
- අනුන් අවඥාවට හා ගර්හාවට ලක් කිරීමේ පුරුද්ද

**එක් චරිතයක දුර්ගුණ හතරක් දක්වා ඇත්නම් ලකුණු 04**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(i). ඉන් එක් චරිතයක් තෝරාගෙන නාට්‍ය විකාශයට එම චරිතයේ ඇති වැදගත්කම පහදන්න.**

**කැසියස්**

- මුල සිට ම ද්වේෂ සහගත සිතින් යුතු ව පසුපස සිට සීසර් ඝාතනය කිරීමේ කුමන්ත්‍රණය මෙහෙයැවූ පුද්ගලයා ය.
- උපක්‍රමශීලී ලෙස නොමග යවා කුමන්ත්‍රණය සඳහා බ්‍රූටස් පොළඹවා ගන්නේ සීසර්ගෙන් පළිගැනීමේ චේතනාවෙන් විනා ජාති වාත්සල්‍යය නිසා නොවේ.
- ප්‍රායෝගික ලෙස සිතන, හා කටයුතු කරන ඔහු නාට්‍ය විකාශනය සම්බන්ධයෙන් අතිශය වැදගත් වන්නේ නාට්‍යයේ මුල් අර්ධයේ සියලු චරිත ඔහු විසින් මෙහෙයැවෙන බැවිනි. දෙවැනි අර්ධයේ ද බ්‍රූටස් හා ඔහු අතර ගැටුම නාට්‍ය රසය තුළ ගැන්වීමට හේතු වෙයි. එහෙයින් කැසියස් මෙහි වීර චරිතය වන ජූලියස් සීසර් හා ඛේදනීය චරිතය වන බ්‍රූටස් හා සමාන ලෙසින් නාට්‍ය විකාශනයෙහි ලා සුවිශේෂ දායකත්වයක් සපයයි.

**ඉයාගෝ**

- ඊර්ෂ්‍යාව, වෛරය, පළිගැනීමේ චේතනාව සිත තුළ කැකෑරෙමින් තිබෙන පුද්ගල චරිතයක් බව ප්‍රේක්ෂකයාට පසක් වේ. ඔහු නාට්‍යයේ සෙසු චරිත සමග සංවාදයේ යෙදෙන්නේ සිය අධම චරිත ලක්ෂණ ප්‍රේක්ෂකයාට ප්‍රදර්ශනය කරවමිනි.
- නාට්‍යයේ වීරයා වන ඔතෙලෝගේ විශ්වාසය දිනාගෙන ඔහුට සමීප ව සිටිමින් සූක්ෂ්ම ලෙස හා ඉතා ක්‍රෑර ලෙස සිය පළිගැනීමේ අරමුණ සාර්ථක කර ගනිමින් ඔතෙලෝ විනාශය කරා ඇද දැමීම දක්වා නාට්‍ය විකාශයේ ලා ඔහුගේ භූමිකාව අතිශය වැදගත් ය. නාට්‍යයේ සියලු චරිත ඔහු අතේ නැටැවෙන රූකඩ බඳු ය.

**ප්‍රමාණවත් ලෙස කරුණු දක්වා ඇත්නම් ලකුණු 05 දෙන්න.**

(iii) **ඉහත නාට්‍ය දෙකින් එකක් තෝරාගෙන පුද්ගලයකු ගේ සිත වැරදි මාර්ගයකට පෙළඹවීමට පූර්වෝක්ත චරිත සතු හැකියාව විවරණය කරන්න.**

කැසියස් සහ ඉයාගෝ යන චරිත දෙක තමන්ගේ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා අන් අය පොළඹවා ගන්නේ එසේ පොළඹවාගන්නා චරිතවල ඇති යම් දුර්වලකමක් නිසා ය. මෙම චරිත දෙක ම සාර්ථක වන්නේ ඔවුන් එම දුර්වලකම වටහාගන්නා බැවිනි.

**එම කරුණ පැහැදිලි වන සේ ලියා ඇති පිළිතුරකට ලකුණු 6 ක් ද, එසේ නොමැති විට ලියා ඇති කරුණු සලකා ඒ අනුව ද ලකුණු ලබා දෙන්න.**

6. (i) **'ඇන්ටිගනී' නාට්‍යයේ ඇන්ටිගනී හා 'රූකඩ ගෙදර' නාට්‍යයේ නෝරා කිසියම් අභීෂ්ටාර්ථ දෙකක් උදෙසා සටන් වදිති. එම අභීෂ්ටාර්ථ කවරේදැ යි ඔබේ අදහස අනුව පෙන්වා දෙන්න.**

- ඇන්ටිගනීගේ අභීෂ්ටාර්ථය වනුයේ සිය සහෝදරයන් දෙදෙනාගෙන් සම්මත ආගමානුකූල අවමංගල්‍යයක් හිමි නොවූ සොයුරාට එය ලබා දීම යි. එය කිසිදු ආත්ම ලාභයකින් තොර වූවකි. මරණයෙන් මතු ආත්මය පදනම් වූ විශ්වාසයක පිහිටා කරනු ලබන සටනකි.
- නෝරා සටන් වදින්නේ ගතානුගතිකත්වයෙන් මිදීමට යි. නීතියේ හැටියට මරණාසන්න පියාගේ කරදර අඩු කිරීමත්, සැමියාගේ ජීවිතය බේරා ගැනීමත් වරදක් ලෙස සැලකෙන්නේ නම් එවැනි නීතියකින් ඇති ඵලය කුමක්දැ යි ඇය ප්‍රශ්න කරයි. ඇයගේ අභීෂ්ටාර්ථය පුළුල් සමාජ සම්මුතියක් වෙනස් කිරීම ය.

**ලකුණු 04**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ii) **එකී අභීෂ්ටාර්ථ ඉදිරියේ ඔවුන්ගේ සාර්ථක අසාර්ථකභාවය සාකච්ඡාවට ලක් කරන්න.**

- ඇන්ටිගනීගේ අභීෂ්ටාර්ථය ක්‍රියොන්ගේ අභීෂ්ටාර්ථය හා ගැටීමෙන් නාට්‍යමය ක්‍රියාව විකාශනය වේ. ඇය සිය අරමුණ සාක්ෂාත් කරගැනීමට ගන්නා ක්‍රියා මාර්ගයත්, එය වැළැක්වීමට ක්‍රියොන් ගන්නා ක්‍රියා මාර්ගයත් හේතුවෙන් නාට්‍ය ඒකීය ධාරණාවක් ඔස්සේ විකාශනය වන අතර, ඇන්ටිගනී මිය ගිය ද, නාට්‍යයේ වීර චරිතය බවට පත් වෙයි. එසේම අවසානයේ සිය සොයුරාට ගෞරවණීය අවමඟුලක් හිමි කරදීමට ඇයට හැකියාව ලැබේ. එහෙයින් ඕ සාර්ථක වෙයි. ගැටුමෙන් පරාජය ලබන ක්‍රියොන් ඛේදනීය වීරයා බවට පත්වෙයි.

- නෝරා සිය අභීෂ්ටාර්ථය සාක්ෂාත් කරගනු පිණිස සිය කුටුම්බය අතැ'ර නික්ම යයි. ඇය යථාර්ථය පසක් කර ගනී. ඇයගේ අරමුණ ඇයට පමණක් සීමා වුවක් නො වේ. පුළුල් සමාජ ගැටලුවකට කරන ආමන්ත්‍රණයකි. එහෙයින් නෝරා සාර්ථක ය.

**අපේක්ෂකයන් මීට වඩා වෙනස් තර්ක ගොඩ නැගීමට ඉඩ ඇත. ඉදිරිපත් කොට ඇති කරුණු සලකා ඒ අනුව ලකුණු ප්‍රමාණයක් ලබා දෙන්න. මෙහි දී අපේක්ෂකයන් ගේ මතය සලකා බැලීම වැදගත් ය. ලකුණු 05**

(iii) **රූකඩ ගෙදර නාට්‍යයේ සියල්ල සමථයකට පත් වුව ද, නෝරා ගෙදරින් පිට ව යන්නේ මන්දැ යි පහදන්න.**

සියල්ල සමථයකට පත් වූ බව ප්‍රේක්ෂකයා දුටුව ද, නෝරා යථාර්ථය පසක් කර ගන්නේ අවසානයේ ය. ඇය අපේක්ෂා කළ පරිදි 'පුදුම දේ' සිදු වුයේ නැත. හෙල්මගේ සමාව ලැබීමෙන් ඇයට තෘප්තිමත් වීමට නොහැකි ය. ඇය සටන් කරන්නේ වඩා පුළුල් අරමුණක් උදෙසා ය.

**ලියා ඇති කරුණු සලකා ලකුණු ලබා දෙන්න. ලකුණු 06**

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .